නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ ඇඟිලි හා ආහාර තැටිය පිසදා අනුභව කරන මෙන් නියෝග කොට, නියත වශයෙක් බරකත් හෙවත් අභිවෘද්ධිය ඇත්තේ කවර දෙයක දැයි ඔබ නොදන්නෙහුය යැයි පවසා සිටියහ.

ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ ඇගිලි හා ආහාර තැටිය පිසදා අනුභව කරන මෙන් නියෝග කොට, නියත වශයෙන්ම බරකත් හෙවත් අභිවෘද්ධිය ඇත්තේ කවර දෙයක දැයි ඔබ නොදන්නෙහුය යැයි පවසා සිටියහ.“ තවත් වාර්තාවක, “ඔබ අතුරින් කිසිවකුගේ ආහාර කැබැල්ලක් බිම වැටුනු විට, එය අහුලා එහි තැවරී ඇති හානිදායක දෑ ඉවත් කොට එය අනුභව කරත්වා! එය ෂෙය්තාන් වෙනුවෙන් අතහැර නොදමනු. තම ඇගිලි උරණ තෙක් තම අත අත්පිසනයෙන් පිස නොදමනු. හේතුව ඔහුගේ ආහාරයේ කවර අංශයක අභිවෘද්ධිය ඇත්තේ දැයි ඔහු නොදන්නා බැවිනි.“
තවත් වාර්තාවක, “ඔබ අතුරින් කෙනෙකු වෙත තම සෑම කටයුත්තකදීම සැබැවින්ම ෂෙය්තාන්
සම්මුඛ වන්නේය. ඔහු ආහාර ගන්නා අවස්ථාවේ දී පවා ඔහු වෙතට සම්මුඛ වන්නේය. ඔබ
අතුරින් කිසිවකුගේ ආහාර කැබැල්ලක් බිම වැටුනේ නම් එහි ඇති අහිතකර දෑ පිසදමා එය
අනුභව කරත්වා! එය ෂෙයිතාන් වෙනුවෙන් අතහැර නොමනු.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

අනුභව කිරීමේ විනය අතුරින් එක් විනයක් පිළිබඳ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා කර ඇති ප්රකාශය ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් විසින් දන්වා ඇත. එනම්, මිනිසෙකු ආහාර අනුභව කොට අවසන් වී නම් ඔහු තම ඇඟිලි හා පිඟාන පිසදා එය අනුභව කළ යුතු වේ. එනම්, ආහාරයේ කිසිදු සලකුණක් එහි ඉතිරි නොවන තරමට පිසදැමීමයි. හේතුව සැබැවින්ම ඔබගේ ආහාරයේ කවර අංගයක බරකත් හෙවත් අභිවෘද්ධිය ඇත්තේ දැයි ඔබ නොදන්නා බැවිනි. එමෙන්ම ආහාර ගැනීමේ විනය අතර තවත් කරුණක් වන්නේ, කෙනෙකුගේ ආහාර කැබැල්ලක් බිම වැටුණු විට එය අතහැර නොදැමිය යුතුය. ෂෙයිතාන් මිනිසාගේ සියලු කටයුතුවල සම්මුඛ වෙයි. ඒ අනුව එම ආහාර කැබැල්ල ඔහු අර ගනු ඇත. නමුත් අප බලමින් සිටිය දී ඔහු එය නොගනු ඇත. එය ගුප්ත කරුණකි. එය අපට දසුන් නොවෙයි. නමුත් සත්යවන්ත සත්යවාදී යැයි පිළිගනු ලැබූ උත්තමයාණන්ගේ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- පුවතින් එය අපට උගන්වා ඇත. ෂෙයිතාන් එය රැගෙන අනුභව කරයි. අප ඉදිරියේ භෞතික වශයෙන් යමක් ඉතිරිව තිබුණද එය ගුප්ත ලෙසින් ඔහු අනුභවය කරයි. ගුප්ත කරුණු අතුරින් වූ මෙය අනිවාර්යයයෙන් අපි තහවුරු කළ යුත්තකි.

https://sunnah.global/hadeeth/si/show/10103


النجاة الخيرية
ALNAJAT CHARITY


لجنة الدعوة الإلكترونية
EDC
E-Da'wah Committee